# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

**සමාජීය විද්‍යා පීඨය**

**ජාත්‍යන්තර අධ්‍යයනය (පැරණි නිර්දේශය)**

**ජාත්‍යන්තර ආර්ථික කටයුතු INTS – E 2015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ජාත්‍යන්තර පද්ධතිය තුළ මෑත කාලයේ පැවති අර්බුදකාරී තත්ත්වයන් අන්තර්ජාතික ආර්ථික කටයුතු කෙරෙහි සිදුකර ඇති බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. i. ජාත්‍යන්තර වෙළෙඳාමේ වාසි සහ අවාසි පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 10)

    ii. ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ නිරපේක්ෂ වාසි න්‍යාය සහ සාපේක්ෂ වාසි න්‍යාය පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. කොවිඩ් වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සංචාරක කර්මාන්තයට සිදුවී ඇති බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 20)

05. ඉන්දියානු සාගර කලාපීය රාජ්‍යයන් අතර ආර්ථික සහයෝගීතාව ශක්තිමත් කිරීමෙහිලා ඉන්දියානු සාගර වටද්දර සංවිධානයේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. "චීනය විසින් ක්‍රියාත්මක කොට ඇති තීරයක් - මාවතක් වැඩසටහන වර්තමාන ජාත්‍යන්තර ආර්ථික කටයුතු කෙරෙහි සුවිශේෂී බලපෑමක් සිදුකොට ඇත." විමසන්න. (ලකුණු 20)

07. සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමේ දී ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ට මුහුණ දීමට සිදුවී ඇති ප්‍රධාන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

    i. ගෝලීයකරණය
    ii. අග්නිදිග ආසියානු ආර්ථික ප්‍රජාව (ASEAN Economic Community)
    iii. ජාත්‍යන්තර වෙළෙඳාමට ඇති බාධක
    iv. ආසියානු සංවර්ධන බැංකුව

(ලකුණු 10X2=20)

***************************